# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

10 ශ්‍රේණිය | නර්තනය | 22 - ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රභවය

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) විසිවන සියවසේ මුල් භාගයේ දී මෙතුමාගේ පැමිණීම ශ්‍රී ලාංකේය නර්තන කලාවේ අභිවෘද්ධියට බලපෑ සිදුවීමකි.

1) රත්නශංකර් පඬිතුමා  2) රවීන්ද්‍රනාත් තාගෝර්තුමා
3) ශ්‍රී මීනාක්ෂි සුන්දරම්පිල්ලේ  4) මහත්මා ගාන්ධිතුමා

02) ක්‍රි.ව. 1940 ගණන්වල භාරතයට ගොස් නර්තන කලාව හැදෑරූ ශ්‍රී ලාංකේය නර්තන ශිල්පීන් කවුරුන් ද?

1) ශේෂා පලිහක්කාර සහ සෝමබන්දු  2) චිත්‍රසේන සහ පණීභාරත
3) වසන්ත කුමාර සහ ලයනල් එදිරිසිංහ  4) ගංගානාථ සහ රුක්මණී දේවි

03) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ ප්‍රථම නෘත්‍ය නාට්‍ය (Dance Drama) කුමක් ද?

1) සීතාහරණ  2) රාවණා
3) රාම සහ සීතා  4) ශිවරංග

04) ශ්‍රී ලංකාවේ ප්‍රථම නෘත්‍ය නාට්‍ය නිෂ්පාදනය කළේ කවුරුන් ද?

1) ආචාර්ය චිත්‍රසේන ඩයස්  2) විල්මට් ඒ. පෙරේරා
3) රවීන්ද්‍රනාත් තාගෝර්  4) ශාන්ති දේවසෝෂ්

05) මුද්‍රා නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,

1) ගායනය කරමින් කතා පුවත ඉදිරිපත් කිරීමයි.
2) සංගීතයට අනුව නර්තනය මඟින් කතා පුවත ඉදිරිපත් කිරීමයි.
3) ගායනයට අනුව මුද්‍රා මඟින් කතා පුවත ඉදිරිපත් කිරීමයි.
4) සංවාද සහ ගීත මඟින් කතා පුවත ඉදිරිපත් කිරීමයි.

06) චිත්‍රසේන ඩයස් මහතාගේ නිර්මාණයක් නොවන්නේ,

1) කිංකිණි කෝලම  2) ශිවරංග
3) බෙර හඬ  4) රාවණා

07) ජාතික මුද්‍රා නාට්‍ය දිනය කවදා ද?

1) ජනවාරි 26  2) අප්‍රේල් 27
3) අප්‍රේල් 29  4) ජූනි 24

08) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය දිනය නම් කර ඇත්තේ කුමන මුද්‍රා නාට්‍ය ශිල්පියාගේ ජන්ම දිනය මුල් කරගෙන ද?

1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර  2) ආචාර්ය එස්. පණීභාරත
3) ආචාරය් චිත්‍රසේන ඩයස්  4) ආචාර්ය නිමල් වෙල්ගම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

09) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය සඳහා ''මුද්‍රා නාට්‍ය'' යන නාම භාවිතය ප්‍රථමයෙන්ම යොදා ගත්තේ කවරෙකු විසින් ද?

1) ප්‍රේමකුමාර එපිටවල මහතා
2) නිමල් වෙල්ගම මහතා
3) ශේෂා පලිහක්කාර මහතා
4) චිත්‍රසේන ඩයස් මහතා

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

10) ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාව කෙරෙහි ඍජුවම බලපා ඇත්තේ ....................................... මුද්‍රා නාට්‍ය කලාවයි.

11) ක්‍රි. ව. 1930 දශකයේ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව ප්‍රභවය ලබන්නේ ....................................... ආයතනය මුල් කොට ගෙනය.

12) රවීන්ද්‍රනාත් තාගෝර්තුමා මෙරටට පැමිණි අවස්ථාවේ ඔහුගේ ....................................... නමැති නෘත්‍ය නාට්‍ය රඟ දක්වන ලදි.

13) පාසල් මුද්‍රා නාට්‍ය නිර්මාණයේ පුරෝගාමියා ලෙස ....................................... මහතාට හඳුන්වනු ලබයි.

14) ප්‍රශස්ත ළමා මුද්‍රා නාට්‍යකලාවක් බිහි කිරීමෙහිලා ....................................... මහත්මිය පුරෝගාමී වූවාය.

15) පරවිය, ......................................., දියවන්නා යන මුද්‍රා නාට්‍ය ....................................... මහතාගේ නිර්මාණයන් වේ.

16) ප්‍රේමකුමාර එපිටවල මහතා විසින් ඔහුගේ මුද්‍රා නාට්‍ය හැඳින්වීමට යොදා ගත්තේ ....................................... යන නාමයයි.

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

17) මුද්‍රා නාට්‍ය යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.

18) ''ශාන්ති දේවසොෝෂ්'' මෙරටදී නිර්මාණය කළ නෘත්‍ය නාට්‍ය හතරක් නම් කරන්න.

19) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවට ඉමහත් සේවයක් කරන ලද මුද්‍රා නාට්‍ය ශිල්පීන් පස්දෙනෙක් නම් කර ඔවුන්ගේ මුද්‍රා නාට්‍ය දෙක බැගින් ලියන්න.

20) දේශීය මුද්‍රා නාට්‍ය කලාවෙහි ප්‍රභවය කෙරෙහි ශ්‍රී පාලි ආයතනයේ දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

21) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භය පිළිබඳ විස්තර කරන්න.

සැකසුම:- නවමල් ජයවීර මයා

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!